# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.18 පැය 1515 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1766 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ව්‍යාජ මුදල් නෝට්ටු සමඟ සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - හබරණ පොලිස් ස්ථානය.**

2025.09.17 වන දින සවස් කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ නගරයේදී පොලිස් නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කර ඔහු සන්තකයේ රුපියල් 5000/= ව්‍යාජ මුදල් නෝට්ටු 03 ක් හමුවීමෙන් පසු සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුගෙන් ප්‍රශ්න කර අනාවරණය වූ තොරතුරු මත හබරණ සහ අනුරාධපුර යන ප්‍රදේශවලදී තවත් රුපියල් 5000/= ව්‍යාජ නෝට්ටු 02 බැගින් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. වැඩිදුර විමර්ශනයේදී 2025.09.18 වන අද දින අළුයම් කාලයේදී පිහිඹියගොල්ලෑව පොලිස් වසමේදී රුපියල් 5000/= ව්‍යාජ නෝට්ටු 138 ක්, ලැප්ටොප් යන්ත්‍රයක්, ස්කෑන් සහ මුද්‍රණ යන්ත්‍රයක් සමඟ මෙම ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 23 ත් 42 ත් අතර වයස්වල පසුවන හබරණ, අනුරාධපුර සහ පෑදෑව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

දෛනික අවශ්‍යතා අනුව භාණ්ඩ මිලදී ගැනීමේදී හා විවිධ ගනුදෙනු සඳහා මුදල් පරිහරණය කිරීමේදී එම මුදල් ව්‍යාජ මුදල් නෝට්ටු ද යන්න පිළිබඳව සුපරීක්ෂාකාරීව හා සැලකිලිමත්ව අවධානයෙන් යුතුව තහවුරු කරගැනීමෙන් පසු, මුදල් නෝට්ටු පරිහරණය කිරීමටත්, එවැනි ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකයේ තබා ගන්නා හෝ ගනුදෙනු කරන පුද්ගලයින් පිළිබඳව තොරතුරු ලද වහාම ශ්‍රී ලංකා පොලිසිය දැනුවත් කරන ලෙසටත් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**